
**11 ශ්‍රේණිය**
**සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය**
**පැවරුම් - නෙට්බෝල් ක්‍රීඩාව හා පාපන්දු ක්‍රීඩාව**

1) නෙට්බෝල් ක්‍රීඩාවේදී සිදුවන පාද හා සම්බන්ධ වැරදි දෙකක් ලියන්න
2) නෙට්බෝල් ක්‍රීඩාවේදී මැද යැවුමක් යැවීමේදී (Center Pass) එය ලබාගතහැකි ක්‍රීඩිකාවන්ගේ ස්ථාන නාම ලියන්න
3) මෙම රූප සටහනට අනුව පාට කරන ලද සීමාවේ ක්‍රීඩාකල හැකි ක්‍රීඩිකාවන්ගේ ස්ථාන නාම ලියන්න



4) නෙට්බෝල් ක්‍රීඩාව විනිශ්චය කිරීමට ඔබට පැවරී ඇත්නම් පහත සඳහන් එක් එක් අවස්ථාවලදී ඔබ විසින් දෙනු ලබන තීරණ කුමක් දැයි වෙන වෙනම ලියන්න

I. ක්‍රීඩිකාවන් තත්පර තුනකට වඩා පන්දුව අතේ තබාගෙන සිටීම
II. ප්‍රතිවාදි ක්‍රීඩිකාව තල්ලු කිරීම
III. ක්‍රීඩා පිටියේ ඉරිවලින් පන්දුව පිටතට යාම
IV. දෙපිලේ ක්‍රීඩිකාවන් එකවර වරදක් කළ විට
V. ගෝල් සීමාව තුලදී ප්‍රතිවාදි ක්‍රීඩිකාවක් පන්දුව විදීම සිදුකරන අවස්ථාවකදී දෘෂ්ටියට බාධාකිරීම

5) පාපන්දු ක්‍රීඩාවේදී පන්දුව වෙනත් ක්‍රීඩකයෙකුට හෝ ස්ථානයකට හෝ යොමුකිරීම සඳහා යොදාගන්නා පන්දු පහර 2ක් නම් කරන්න

6) ප්‍රතිවාදි පිලට දඬුවම් පා පහරක් ලබාදීම සඳහා පාපන්දු ක්‍රීඩා පිටියේ දඬුවම් පෙදෙසෙදි සිදුවිය හැකි වැරදි 2ක් ලියන්න

7) මුලු පහරක් (Corner Kick) ලබාදීමට විනිශ්චයකරු තීරණය කරනු ලබන්නේ කවර අවස්ථාවේදීද?

8) පාපන්දු තරගයක විනිසුරු වශයෙන් පහත සඳහන් අවස්ථාවලදී ඔබ ලබාදෙන තීරණ සඳහන් කරන්න

    I. පාපන්දු තරගයකදී එක් පිලක් ක්‍රීඩකයින් හය දෙනෙකුගෙන් ක්‍රීඩාකිරීමට ක්‍රීඩා පිටියට පිවිසෙයි

    II. තරගයක් අතරතුර පිටියෙන් පිටතට ගිය පන්දුව තුලට විසිකිරීම සඳහා ඉදිරිපත් වූ ක්‍රීඩකයා එක් පාදයක් ඔසවා පන්දුව තුලට යැවීම

    III. තරගයක් අතරතුර ප්‍රතිවාදි ක්‍රීඩකයාට ප්‍රබල අනතුරුදායක පා පහරක් එල්ල කිරීම

    IV. තරගය ආරම්භ කරන සංඥාව ලබාදුන් පසු පන්දුව හිමි ක්‍රීඩකයා පන්දුව තම පිලේ පිටුපස දෙසට යොමු කිරීම

    V. දඬුවම් ප්‍රදේශය තුලදී ප්‍රතිවාදියෙකු පාදයෙන් පහර දීම